


# පන්දුවාර 20 ක්‍රිකට් ක්‍රීඩාවටත් ලෝක කුසලාන තරගාවලියක්

**කසුන් සේනාරත්න**



ක්‍රිකට් ක්‍රීඩාව ජාත්‍යන්තර තත්ත්වයට පත් කරමින් පළමු වන ටෙස්ට් ක්‍රිකට් තරගය පවත්වනු ලැබුවේ 1877 වසරේදී ය. එංගලන්තය හා ඕස්ට්‍රේලියාව අතර පැවති එම තරගයත් සමග ක්‍රිකට් ක්‍රීඩාවට ටෙස්ට් තත්ත්වයක් හඳුන්වා දුන්නේය.
දැන් ඒ ඉතිහාසය වසර 129 ක් පැරණිය. ඒ අතර කාල පරාසය තුළ ටෙස්ට් තත්ත්වය හිමි කරගත් රටවල් සංඛ්‍යාව ඉහළ ගොස් ඇත්තේ රටවල් 10 ක් දක්වාය. ඉනුදු සිම්බාබ්වේ පිල දැනට තාවකාලික වශයෙන් ටෙස්ට් තත්ත්වයෙන් ඉවත් කර ඇත.
මේ අනුව පැහැදිලි වන්නේ කුමන රටකට වුවද ක්‍රිකට් ක්‍රීඩාවේ ටෙස්ට් තත්ත්වය හිමි කර ගැනීම ඉතා අසීරු බවකි.

එසේ වුවත් ක්‍රිකට් ක්‍රීඩාව වෙනුවෙන් ලෝක කුසලාන තරගාවලියක් පවත්වන්නේ ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩාව වෙනුවෙන් නොවීමත් එවැන්නක් 1975 වසරේ ඇරඹෙන්නේ එක්දින ක්‍රිකට් ක්‍රීඩාව වෙනුවෙන් වීමත් සුවිශේෂිත කරුණුය.
කොහොම නමුත් 1975 වසරේ ආරම්භ වූ ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලිය නිසා එක්දින ක්‍රිකට් ක්‍රීඩාව ලෝකය පුරා වඩ වඩාත් ජනප්‍රිය වීම ආරම්භ වී තිබුණි.
එක්දින ක්‍රිකට් ක්‍රීඩාව තුළින් සිදුවූයේ දින 5 ක් තිස්සේ ඇදුනු ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩාව එක්දිනක් දක්වා කෙටි කිරීමකි. ක්‍රීඩාවක් පැවැත්වෙන කාලය පමණට වඩා දිගු වීම ක්‍රීඩකයන්ට පමණක් නොව නරඹන්නන්ටද ගෙන දෙන්නේ වෙහෙසකර බවකි.
එක් දිනයක් දක්වා ක්‍රිකට් ක්‍රීඩාව කෙටි වුවද එය පවා වෙනත් ක්‍රීඩා හා සසඳන විට දිග වැඩිය.
මෙම තත්ත්වය නිසා ක්‍රිකට් ක්‍රීඩාව ලොව පුරා තව තවත් ජනප්‍රිය කරවීමට උත්සාහ දරන්නන්ට අවශ්‍ය වූයේ ක්‍රිකට් තරගයකට වැය කරන කාලය තව තවත් කෙටි කිරීමටය.
පන්දු වාර 20 ක්‍රිකට් ක්‍රීඩාව හඳුන්වා දෙන්නේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. මේ වනවිට ලෝක අවධානය වඩාත් යොමුව ඇත්තේද පන්දුවාර 20 ක්‍රිකට් ක්‍රීඩාවට යයි පැවසුවහොත් එය නිවැරදිය.
පන්දු වාර 20 ක්‍රිකට් ක්‍රීඩාවට ඉතාමත් ඉක්මණින් එවන් පරිසරයක් ගොඩ නැගුණු බැවින් ලබන වසරේ ලෝක කුසලාන තරගාවලියක් පැවැත්වීමටද දැන් සියලු කටයුතු සැලසුම් කර ඇත.
ඒ අනුව එම මංගල තරගාවලිය සඳහා දකුණු අප්‍රිකාව සත්කාරය ලබාදීමට ඉදිරිපත්ව සිටියි.
ලබන වසරේ සැප්තැම්බර් මාසයේ පැවැත්වීමට අදහස් කර ඇති එම තරගාවලියට ජොහැන්නස්බර්ග් කේප්ටවුන් හා ඩර්බන් යන නගරයන් හී පිහිටි වොන්ඩර්ස් නිව්ලන්ඩ් හා කිංග්ස්මේඩ් යන ක්‍රීඩාංගණ තෝරා ගෙන ඇත.
තරගාවලියේ අධ්‍යක්ෂ වරයා ලෙස කටයුතු කරන්නේ දකුණු අප්‍රිකානු ක්‍රිකට් පිල නියෝජනය කළ වේගපන්දු යවන්නෙකු වූ ස්ටීව් එල්වර්තිය.
ඔහු කියා සිටින්නේ මෙම තරගාවලිය දකුණු අප්‍රිකානු ක්‍රිකට් ක්‍රීඩාවේ තත්ත්වයත් දකුණු අප්‍රිකාව සතු සංවිධාන ශක්තියත් ලෝකයා හමුවේ තබන්නටත් ලැබුණු අගනා අවස්ථාවක් බවය.

Pure Ceylon
Esher Tea
The Best Known name in Tea

## ශ්‍රී ලංකාවේ මේසපන්දු පියුම විකසිත කළ හිරුකිරණ
# දීපිකා රොඩ්රිගු

මේසපන්දු ක්‍රීඩාවේ සුපිරිතමයින් සිටින්නේ ආසියානු කලාපයේය. එබැවින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ජාත්‍යන්තර තලයට පහසුවෙන් ලඟාවිය හැකි ක්‍රීඩාවක් ලෙස මේසපන්දු හැඳින්විය හැකිය. නමුත් මේ වසරේ අගෝස්තු මාසය තෙක්ම ශ්‍රී ලංකාවෙන් බිහිවු මේසපන්දු ක්‍රීඩකයෙකු හෝ ක්‍රීඩිකාවක අවම වශයෙන් දකුණු ආසියානු තත්ත්වයෙන් වුව අවධානයට ලක්වන දක්‍ෂතා පෙන්වා නොතිබීම අවාසනාවන්ත තත්ත්වයක්. නමුත් එය කිසිවෙකුගේ විමතියට කරුණක්ද වූයේ නැත.
එහෙත් පසුගියදා පැවැති 10 වැනි දකුණු ආසියානු ක්‍රීඩා උළෙලේදී ප්‍රතිවාදී කණ්ඩායම් නියෝජනය කළ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ද ඇතුළු ක්‍රීඩා ලෝලීන් හැමකෙනෙකුගේම මහත් සේ විවර වූ දෑස් තමන් වෙත රඳවා තබා ගන්නට එක් ශ්‍රී ලාංකික මේසපන්දු ක්‍රීඩිකාවක සමත් වුවාය.
ඇත්ත වශයෙන් දකුණු ආසියානු කලාපයේ මේසපන්දු බලවතා ලෙස වැජඹෙන ඉන්දීය කණ්ඩායමට මෙවර ඉතිහාසයේ පළමු වතාවට තමන්ට හිමි රන්පදක්කම් රැක ගන්නට විශාල සටනක් කරන්නට සිදුව තිබුණි.
ශ්‍රී ලංකාවට ඉකුත් දා අවසන් වූ දකුණු ආසියානු ක්‍රීඩා උළෙලේදී මේසපන්දු ක්‍රීඩාවෙන් රිදී පදක්කම් 3 ක් හා ලෝකඩ පදක්කම් 6 ක් හිමිවිය.
දකුණු ආසියානු ක්‍රීඩා උළෙලකදී ශ්‍රී ලංකාව පළමු වරට මේසපන්දු ක්‍රීඩාවෙන් පදක්කමක් දිනාගෙන ඇත්තේ 1991 වසරේය. එවර හිමිව ඇත්තේ ලෝඩක පදක්කමකි. 1993 වසරේ ලෝකඩ පදක්කම් දෙකක් හා එක් රිදී පදක්කමක් දිනා ගත්තේය. ඒ අනුව ශ්‍රී ලංකාව පළමු වන මේසපන්දු රිදී පදක්කම එවර දිනාගෙන තිබුනේ කාන්තා කණ්ඩායම් ඉසව්වේදීය.
අනතුරුව 1995 වසරේ ලෝකඩ පදක්කම් 5ක්, 1999 වසරේ ලෝකඩ පදක්කම් 06 ක් හා 2004 වසරේ ලෝකඩ පදක්කම් 08 ක් වශයෙන් දකුණු ආසියානු ක්‍රීඩා උළෙලවලදී ශ්‍රී ලංකාව සංඛ්‍යාත්මකව දිනන පදක්කම් ප්‍රමාණය ඉහල නංවා තිබුණි.
එම තත්ත්වය තවදුරටත් ආරක්‍ෂා කර ගනිමින් මෙවර පදක්කම් 09 ක් දිනා ගන්නට සමත් වූ ශ්‍රී ලංකා මේසපන්දු කණ්ඩායමේ කුසලාන වඩාත් ඇගයීමට ලක්කළ හැක්කේ ඊට රිදී පදක්කම් 03 ක්ම එකතු කර තිබූ බැවිණි. එපමණක්ද නොව එහි තවත් විශේෂත්වයක් ද විය. ඒ අනුව ඉතිහාසයේ පළමු වරට දකුණු ආසියානු ක්‍රීඩා උළෙලකදී මේසපන්දු ක්‍රීඩාවේ කේවල ඉසව්වකින්ද රිදී පදක්කමක් දිනා ගැනීම සටහන් කෙරුණි.
මෙම රිදී පදක්කම ශ්‍රී ලංකාවේ තිළිණ කරනු ලැබුවේ 28 හැවිරිදී ජාතික ශූරිය වූ දීපිකා රොඩ්රිගු විසිනි. කාන්තා කේවල ඉසව්වෙන් ඇය එම රිදී පදක්කම හිමි කර ගනු ලැබුවේ එහි රන්පදක්කම සඳහා 22 හැවිරිදි ඉන්දීය ජාතික ශූරිය වූ මවුම දාස් සමඟ කළ තරගයෙන් පරාජය වූ බැවිනි. එම අවසන් තරගයේදී දීපිකා මවුමා දාස් අතින් පරාජය වී තිබුනද එම තරගාවලියේ අවස්ථා දෙකකදී වට දෙකකදීම ඇය පරාජය කරන්නට දීපිකා රොඩ්රිගු සමත් වූවාය.
තවද මෙවර කාන්තා කණ්ඩායම් ඉසව්වේ රන් පදක්කම ශ්‍රී ලංකාවට අහිමි වූයේද දීපිකා රොඩ්රිගු හා මවුමා දාස් අතර

32 පිටට

## ICC Champions Trophy, 2006/07



**October 2006**
**Sat 14**
6th Qualifying Match - Sri Lanka v West Indies
Brabourne Stadium, Mumbai
**Sun 15**
1st Match - India v England
Sawai Mansingh Stadium, Jaipur
**Mon 16**
2nd Match - New Zealand v South Africa
Brabourne Stadium, Mumbai
**Tue 17**
3rd Match - Pakistan v TBC
Sawai Mansingh Stadium, Jaipur
Q1 qualifier
**Wed 18**
4th Match - Australia v TBC
Brabourne Stadium, Mumbai
Q2 qualifier
**Fri 20**
5th Match - New Zealand v TBC
Brabourne Stadium, Mumbai
Q1 qualifier
**Sat 21**
6th Match - Australia v England
Sawai Mansingh Stadium, Jaipur
**Tue 24**
7th Match - South Africa v TBC
Sardar Patel (Gujarat) Stadium, Motera, Ahmedabad
Q1 qualifier
**Wed 25**
8th Match - New Zealand v Pakistan
Punjab C.A. Stadium, Mohali, Chandigarh
**Thu 26**
9th Match - India v TBC
Sardar Patel (Gujarat) Stadium, Motera, Ahmedabad
Q2 qualifier
**Fri 27**
10th Match - Pakistan v South Africa
Punjab C.A. Stadium, Mohali, Chandigarh
**Sat 28**
11th Match - England v TBC
Sardar Patel (Gujarat) Stadium, Motera, Ahmedabad
Q2 qualifier
**Sun 29**
12th Match - India v Australia
Punjab C.A. Stadium, Mohali, Chandigarh

**November 2006**
**Wed 1**
1st Semi Final - TBC v TBC
Punjab C.A. Stadium, Mohali, Chandigarh
**Thu 2**
2nd Semi Final - TBC v TBC
Sawai Mansingh Stadium, Jaipur
**Sun 5**
Final - TBC v TBC
Brabourne Stadium, Mumbai